දැහැමි සිහිනය අල්ලාහ්ගෙන් වූවකි. දුෂ්ට සිහිනය ෂෙයිතාන්ගෙන් වූවකි. එහෙයින් ඔබ අතරින් කිසිවෙකු හෝ වේවා, තමන් බියට පත් අයුරින් යම් දුෂ්ට සිහිනයක් දුටු විටෙක ඔහුගේ වමතට තුන්වරක් කෙළ ගසන්නාක් මෙන් ඇඟවිය යුතු ය. ඉන් ඇතිවන හානියෙන් ආරක්ෂාව පැතිය යුතු ය. එවිට එය කිසිදු හානිකර බලපෑමක් ඔහුට ඇති නොකරනු ඇත

නබි (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) පැවසූ බව අබූ කතාදා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "දැහැමි සිහිනය අල්ලාහ්ගෙන් වූවකි. දුෂ්ට සිහිනය ෂෙයිතාන්ගෙන් වූවකි. එහෙයින් ඔබ අතරින් කිසිවෙකු හෝ වේවා, තමන් බියට පත් අයුරින් යම් දුෂ්ට සිහිනයක් දුටු විටෙක ඔහුගේ වමතට තුන්වරක් කෙළ ගසන්නාක් මෙන් ඇඟවිය යුතු
ය. ඉන් ඇතිවන හානියෙන් ආරක්ෂාව පැතිය යුතු ය. එවිට එය කිසිදු හානිකර බලපෑමක් ඔහුට ඇති නොකරනු ඇත.
[صحيح] [متفق عليه]

නිින්දේදී දකින සතුටුදායක දැහැමි සිහිනය අල්ලාහ්ගෙන් වූවකි. දුෂ්ට සිහිනය එනම් පිළිකුල් සහගත මෙන්ම ශෝකය ඇති කරන සිහිනය ෂෙයිතාන්ගෙන් වූවකි. යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. කවරෙකු පිළිකුල් සහගත සිහියනක් දුටුවේ ද ඔහු ඔහුගේ වම් දෙසට කෙළ ගසන්නාක් මෙන් ඇගවිය යුතු ය. ඉන් ඇතිවන හානියෙන් ආරක්ෂාව අල්ලාහ්ගෙන් පැතිය යුතු ය. සිහිනය මත පෙළ ගැසුනු පිළිකුල් සහගත දෙයින් ආරක්ෂාව පැතූ බැවින් එසේ මෙනෙහි කරන ලද කරුණ හේතුවක් බවට අල්ලාහ් පත් කරන ඇත. එහෙයින් කිසිදු හානිකර බලපෑමක් ඔහුට ඇති වන්නේ නැත.

http://sunnah.global/hadeeth/si/show/3586